# මණිමේකලා දෙවඟන★

**මංගලිකා ජයතුංග**

Manimekala was a popular deity in South India, Sri Lanka, Miyanmar, Thailand and Cambodia whose name is mentioned in many instances in Pali, Sinhala and Tamil literature. She was a goddess of the sea and seems to have been a patron deity of Kovalan, the hero of the Tamil epic Silappadikaram, whose family were sea traders in Puhar. She was a devoted follower of the Buddha and her special function was to save virtuous people from difficulties faced in the midst of the ocean. Studies of the deity have been made by eminent scholars including Paranavitana (1931) and Sylvain Levi (1996). However so far a comprehensive study of the subject have not been made by any scholar. The objective of this study is to collate all available sources and record them for future studies.

බෞද්ධ දෙවඟනක් ලෙසත්, මුහුදු දෙවඟනක් ලෙසත්, පොදු ජනයා අතර ප්‍රචලිත ව සිටින්නට ඇතැයි විශ්වාස කළ හැකි මණිමේකලා නාමය සාහිත්‍ය මූලාශ්‍රය රැසක සඳහන් ව ඇත. ක්‍රිෂ්ණස්වාමි අයියන්ගර් (1930), සෙනරත් පරණවිතාන (1931), සිල්වේන් ලේවි (1996) ආදි ප්‍රකට පර්යේෂකයන් කිහිප දෙනෙක් මණිමේකලා දෙවඟන පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයන සිදු කොට තිබුණ ද ඒ පිළිබඳ පුළුල් අධ්‍යයනයක් මෙතෙක් සිදු ව නැත. ඇය පිළිබඳ දැනට සොයාගත හැකි සියලු මූලාශ්‍ර එක්රැස් කොට අනාගත පර්යේෂණ සඳහා වාර්තා කොට තැබීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

★ මෙම ලිපියෙහි මණිමේකලා යනුවෙන් යොදා ඇත්තේ පාලි හා දෙමළ මූලාශ්‍රය අනුව යමිනි. සංස්කෘතයෙහි මෙය මණිමේඛලා යනුවෙන් දැක්වුව ද සංස්කෘත මූලාශ්‍රය කිසිවක් මේ සඳහා පරිශීලනය නොකෙළෙමි.

© **මහාචාර්ය මංගලිකා ජයතුංග**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අංජලී වික්‍රමසිංහ

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 21 කලාපය, 2014/2015** මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

පාලි, සිංහල සහ දෙමළ සාහිත්‍ය මූලාශ්‍රය රැසක සඳහන් වන මණිමේකලා ඉන්දියාව, ශ්‍රී ලංකාව, මියන්මාරය, තායිලන්තය හා කාම්බෝජය ආදි රටවල දීර්ඝ කාලයක් තිස්සේ බුහුමනට පාත්‍ර වූ එහෙත් වර්තමානය වනවිට අප්‍රචලිත බවට පත් ව ඇති දෙවඟනකි. පූර්වොක්ත රටවල චිත්‍ර හා මූර්ති කලාවේ ද, කාම්බෝජ නර්තන කලාවේ ද නිරූපණය වන ඇයට ශ්‍රී ලාංකේය යාතුකර්ම සාහිත්‍යයේ ද විශේෂ වැදගත් ස්ථානයක් හිමි ව ඇත. ඇය පිළිබඳ තොරතුරු අන්තර්ගත මූලාශ්‍රය අතරින් ප්‍රමුඛ වනුයේ සංගම් යුගයේ අවසාන භාගයේ දි හෝ පශ්චාත් සංගම් යුගයේ රචනා වන්නට ඇතැයි සැලකෙන **සිලප්පදිකාරම්** සහ **මණිමේකලෛ** යන දෙමළ වීර කාව්‍ය ද්වයයි. **සිලප්පදිකාරම්** කාව්‍යයේ කථානායකයා වන කෝවලන් වරාය යන අරුතැති පුහාරය හෙවත් කාවේරි නදියේ උතුරු ඉවුරේ පිහිටි කාවේරි පටුනෙහි විසූ වෙළඳ තරුණයෙකි. ඔහුගේ පියා මෙන් ම මුතුන් මිත්තන් ද මුහුද ආශ්‍රිත වෙළඳ කටයුතුවල නියැලුණු වෙළඳ නැව් සමූහයක හිමිකාරත්වය දැරූ පුද්ගලයෝ වූහ. **සිලප්පදිකාරමෙහි** පළමුවැනි සර්ගයෙහි දි ම මණිමේකලා දෙවඟන කෝවලන්ගේ කුල දේවතාවිය වශයෙන් හඳුන්වා දෙයි. මුහුදු යාත්‍රා හා බැඳි බොහෝ ත්‍රාසජනක සිදුවීම් පිළිබඳ ව විශේෂ උනන්දුවක් හා ආශාවක් දැක්වූ කෝවලන් සිය මුතුන් මිත්තන් මුහුදේ දි අනතුරට ලක් වූ අවස්ථාවල මණිමේකලා දෙවඟන විසින් ඔවුන් ගලවාගත් ආකාරය පිළිබඳ පුරාවෘත්ත අසා ඇති බව පවසයි (Holmström,1996:2). මේ අනුව දක්ෂිණ භාරතයේ වුසූ වෙළඳ ශ්‍රේණි විසින් මණිමේකලා දෙවඟන අදහන ලදැ යි විශ්වාස කළ හැකි ය. **සිලප්පදිකාරම්** කෘතියේ ඇය පිළිබඳ මීළඟට සඳහන් වන්නේ කෝවලන් සිය විවාහක බිරිය කන්නකිය අතැර මාධවී නම් නර්තකිය සමග වාසයෙන් මාධවිය බිහිකළ දියණියට නම් තබන අවස්ථාවේ ය. මාධවීගේ මව වන චිත්‍රාපති සහ යෙහෙළියන් ඒ පිළිබඳ සාකච්ඡා කරමින් සිටින විට කෝවලන් පැමිණ, තම මුතුන් මිත්තන් මුහුදේ දි දරුණු කුණාටුවලින් ගලවා ගත් තම ආරක්ෂක දෙවඟන හා කුල දේවතාවිය වන මණිමේකලාගේ නාමය තම දියණියගේ ද නම විය යුතු බව අවධාරණයෙන් යුතු ව පවසයි ( Holmström,1996:14).

ඉන් කලකට පසු වැරදි වැටහීමක් හේතුවෙන් මාධවිය අතැර, සිය විවාහක භාර්යාව වන කන්නකිය වෙත යන කෝවලන් ජීවන

වෘත්තියක් අරඹනු වස් කන්නකියගේ සළඹ විකුණනු පිණිස මධුරා පුරය බලා ගිය අවස්ථාවේ දැඩි විපතකට මුහුණ දුන් නමුත් ඔහු ගලවා ගැනීමට ඔහුගේ ආරක්ෂක දෙවඟන පැමිණි බවක් සඳහන් නො වේ. ඇයගේ බල පරාක්‍රමය මුහුදට පමණක් සීමා වී පැවතීම ඊට හේතුව වශයෙන් නිගමනය කළ නො හැක්කේ **මණිමේකලෛ** කාව්‍යයේ මුහුදෙන් බැහැර පෙදෙසේ දී පවා ඇය ක්‍රියාකාරී වූ හෙයිනි. කතුවරයා මණිමේකලා දෙවඟන ලවා ප්‍රකාශ කරවන ධර්ම කරුණු අතර කර්ම විපාකයට වැදගත් තැනක් හිමි වේ. එහෙයින් මධුරා පුරයේ දී කෝවලන් ගලවා ගැනීමට ඉදිරිපත් නො වූයේ කර්ම ඵල භුක්ති විඳීමට ඉඩ හැරීම පිණිස විය හැකි ය. ඒ අනුව ඇය මුහුදට අධිගෘහිත දෙවඟනක මෙන් ම බෞද්ධ දෙවඟනක වශයෙන් ද හැඳින්විය හැකි ය. ඇය මණිමේකලාට සහාය වන්නේ ද බෞද්ධ ධර්ම මාර්ගය විවර කරගනු පිණිස ය. කෝවලන්ගේ පරපුර ජෛනාගමිකයන් හෝ ආජීවක හෙවත් මක්කලි ගෝසාලගේ ආගම ඇදහූවන් බව අනුමාන කළ හැකි ය. කෝවලන්ගේ මරණයෙන් පසු ඔහුගේ පියා බුදු දහම වැළඳගත් බව සඳහන් වීමෙන් ඒ බව සනාථ වේ. එහෙයින් අබෞද්ධ කාන්තාවක වූ මණිමේකලා උදයකුමාරන් නම් චෝල කුමරුන්ගෙන් ඈත් කොට බුදු දහමට යොමු කරවන්නේ මණිමේකලා දෙවඟනගේ උත්සාහයෙන් බව පැහැදිලි ය.

සර්ග තිසකින් සමන්විත **මණිමේකලෛ** කෘතියේ මණිමේකලා දෙවඟනට අතිශය වැදගත් ස්ථානයක් හිමි කොට ඇත. මාධවීගේ දියණියට නම තැබීමේ පුවත එහි පස්වැනි සර්ගයේ සඳහන් වේ. එහි දී ඇය පුහාරයට සම්ප්‍රාප්ත වන්නේ ඉන්ද්‍ර දේව මහෝත්සවයට සහභාගි වනු පිණිස ය. දෙවියන්ගේ රජු ලෙස සැලකෙන ඉන්ද්‍ර දෙවියා උදෙසා වසරක් පාසා දින විසි අටක කාලයක් තිස්සේ පැවැත්වෙන එය නැටුමෙන්, වැයුමෙන් හා ගැයුමෙන් පිරි කාමෝත්සවයකි. සශ්‍රීකත්වය හා වර්ෂාව එහි මූලික අපේක්ෂාවයි. එම පුරයෙහි තරුණියකගේ වෙස්ගෙන එහි පිහිටි පළිඟු ශාලාවේ පිහිටි පූජනීය විහාරය වෙත පැමිණෙන ඇය, එය පැදකුණු කොට අහසට නැග, රාගය, මෝහය හා ද්වේෂය දුරලා, මාර පරාජය කොට, ධර්ම චක්‍රය එහි දහසක් දැති මත කරකැවෙන්නට සැලැස්වීම ප්‍රශංසාවට ලක්කොට, බුදුන් වර්ණනා කිරීම පිණිස තමනට ඇත්තේ එක් දිවක් පමණය යි පවසයි. දේව දුන්නකින් නික්මුණු සරයක් සේ

පැමිණි මණිමේකලා දෙවඟන විහාරස්ථානයේ පිහිටුවා තිබූ සිරිපතුල් වන්දනා කොට, මණිමේකලාගේ පරිවාර ස්ත්‍රිය වන සුතමතියගෙන් කරුණු විමසූ බව එහි සිව්වැනි සර්ගයේ සඳහන් වේ. ඒ අනුව මණිමේකලා වෙත බැඳුණු සිත් ඇති ව ඈ ලුහුබඳින උදයකුමාරන් නම් චෝල කුමරාගෙන් ගැලවීමට තාවකාලික මගක් වශයෙන් විහාරයට දකුණෙන් වූ කුඩා දොරටුවකින් පිටවී ආගමට නැඹුරු යහපත් මිනිසුන් වෙසෙන චක්‍රවාල කෝට්ටය නම් හුදෙකලා පෙදෙස බලා ගමන් කිරීමට උපදෙස් දෙයි ( Holmström,1996ඃ108). අධික වෙහෙසට පත් සුතමතී හා මණිමේකලා චක්‍රවාල කෝට්ටයට පිවිසීමෙන් පසු ඇසිල්ලකින් නින්දට පිවිසුණහ. මණිමේකලා සිය දෝතට ගත් දෙවඟන යොදුන් තිසක් දකුණින් පිහිටි මණිපල්ලවම් නම් දිවයිනට ඇය රැගෙන ගියා ය. මණිපල්ලවම් යනු ශ්‍රී ලංකාවේ පිහිටි වර්තමාන නෙයිනතිවු දූපත සේ සැලකේ. ඇය එහි දමා නැවත පුහාරයට එන දෙවඟන යහනේ වැතිරී එහෙත් නිදි වර්ජිත ව සිටින උදයකුමාරන් අමතා පවසන්නේ ගිහිගෙය අතැර දැමීමේ අපේක්ෂාවෙන් සිටින තරුණියක කෙරෙහි දක්වන නිරර්ථක ආලය අතහැර දමන ලෙසයි. එසේ ම අයුතු ලෙස කටයුතු කළහොත් ඔහුගේ රාජ්‍යයට නියගය හා දුර්භික්ෂය උදා වී පුර වැසියන් මිය යා හැකි බවට අනතුරු හඟවයි. අනතුරුව ගැඹුරු නින්දක නිමග්න ව සිටින සුතමතිය අවදි කරවා තමා මණිමේකලා මණිපල්ලවම් දූපතට රැගෙන ගිය බවත්, ඇයගේ මව මාධවී හමු වී තමා මණිමේකලා දුටු බව පවසා ඇය අස්වසන ලෙසත්, උපදෙස් දෙයි. එම දූපතේ දී ඇය සිය පූර්ව ජන්මයන් පිළිබඳ සියලු පුවත් දැන යළි පුහාරයට පිවිසෙන බවත්, එවිට පුහාරයේ අරුමැති දේ සිදුවිය හැකි බවත්, ඇය සිය රූපය වෙනස් කොට සිටිය ද සුතමතියට ඇය හැඳිනගත හැකිවනු ඇති බවත් පවසයි. ඇය තව දුරටත් පවසන්නේ ගැඹුරු මුහුදේ යාත්‍රා කරමින් සිටින විශාල නැව් ආරක්ෂා කරන්නේ තමන් බවත්, එසේ ම තමන් කෝවලන්ගේ කුල දේවතාවිය වන බවත් ය ( Holmström,1996ඃ112).

මණිපල්ලවම් දූපතේ සිය පූර්ව ජන්මයන් සිහිපත් කරමින් සිටින මණිමේකලා ඉදිරියෙහි ඇසිල්ලකින් පෙනී සිටින දෙවඟන සිය දෝතෙහි වූ මලින් විහාරය පුදා එය වර්ණනා කරයි. ලක්ෂ්මී යනුවෙන් මණිමේකලා අමතන දෙවඟන ඇයගේ පෙර භවයක

තතු විස්තරාත්මක ව පෙන්වා දෙයි. එහි දී ඇය පෙන්වා දෙන්නේ උදය කුමාරන් නම් චෝල රජු එම භවයේ දී රාහුලන් නමින් ඇයගේ ස්වාමි පුරුෂයා ව සිටි බවයි (Holmström,1996:116). දෙවඟනට ඇය බුදු දහම කෙරෙහි යොමු කිරීමේ දැඩි අධිෂ්ඨානයක් තුබූ බව පැහැදිලි වන්නේ පෙර භවයක සැමියා වීමේ හේතුවෙන් ඇයට උදයකුමාරන් කෙරෙහි යම් සෙනෙහසක් ඇතිවීමෙන් ධර්මයට නැඹුරු නො වීමට ඇති ඉඩකඩ වැළැක්වීමට ඇයට අවශ්‍ය වූ බව පැවසීමයි. ඇය තව දුරටත් පවසන්නේ මණිමේකලා ඉතා තරුණ වීමත් ස්ත්‍රියක වීමත් හේතුවෙන් බොහෝ ගුරුවරු මණිමේකලාට ධර්මය කියා දීමට අකමැති විය හැකි බවයි. දෙවඟන මණිමේකලාට මන්ත්‍ර දෙකක් ලබා දෙන අතර, ඉන් එක් මන්ත්‍රයක් අන්‍යවේශයක් ආරෝපණය කරගැනීම පිණිසත් එක් මන්ත්‍රයක් ආකාශ ගමන් පිණිසත් විය. බෞද්ධ ධර්ම මාර්ගයේ ගමන් ගන්නා ලෙසට අවවාද දෙන ඇය ක්ෂුදා ගින්න නිවා ගැනීම පිණිස උදව්වන මන්ත්‍රයක් ද ඇයට ඉගැන්වූවා ය( Holmström,1996:116). ඉන් අනතුරුව එලඹුණු සියලු උපද්‍රවවලින් ගැලවීමට ඇයට මෙම මන්ත්‍ර උපකාරි විය. මේ අනුව මණිමේකලා දෙවඟන බෞද්ධ ධර්මය මැනවින් දත්, බුදුන් කෙරෙහි දැඩි භක්තියකින් යුත් දෙවඟනක් ලෙස හඳුන්වා දීමට **මණිමේකලෛ** කතුවරයා උත්සුක වූ බව පෙනේ. **මණිමේකලෛ** ග්‍රන්ථයේ ඉදිරි සර්ගයන්හි ඇය ඍජු ලෙස කථාවට සම්බන්ධ නො වන අතර, කතුවරයා කිහිප අවස්ථාවක ඇයගේ තේජස හා බල පරාක්‍රමය හුවා දක්වයි.

මාධවීගේ මව වන චිත්‍රාපති සිය මිණිපිරිය විවාහ නො වී පාත්‍රයක් අතෙහි දරා දුගී, මගී, යාචකාදීන්ට අහර සපයමින් සැරිසැරීම ගැන කෝපයට පත් ව, උදයකුමාරන්ට ඇය සොයාගැනීමට සහාය දැක්වීමට සූදානම් වූ විට, ඊට පැකිළෙන උදයකුමාරන් පවසන්නේ මණිමේකලා දෙවඟන රාත්‍රියෙහි ඔහුට දෘශ්‍යමාන ව එසේ නො කරන ලෙසට අනතුරු ඇඟවූ බවයි. චිත්‍රාපතිගේ බලකිරීම මත එම අනතුරු ඇඟවීම නො තකා මණිමේකලා ලුහුබඳින ඔහු විද්‍යාධරයකු අතින් මරණයට පත්වෙයි ( Holmström,1996:157). කිල්ලිවාලවන් නම් චෝල රජු සමයේ ඉන්ද්‍ර දේව මහෝත්සවය නො පැවැත්වීමේ හේතුවෙන් කෝපයට පත් මණිමේකලා දෙවඟන මුහුද ගොඩ ගැලීමට සලස්වා පුහාරය විනාශයට පත්කළ ආකාරය දහඅටවන සර්ගයේ

විස්තර වේ. අහසට නැගුණු යෝධ රළ පුහාරය එහි ඉතිහාසයත් සමග ගිලගත් බව මණිමේකලාට පවසන්නේ මණිපල්ලව දිවයිනේ දෙවඟන දිවතිලකා ය. මාධවී සහ සුතමතී වඤ්චියට පිටත් ව ගිය බවත්, ආරාවන ආඩිගල් විපතට පත් නො වූ බවත් ඇයට දන්වන ලෙස මණිමේකලා දෙවඟන පැවසූ බවත් එහි විස්තර වෙයි (Holmström,1996:164).

මණිපල්ලවම් නම් දූපතේ බුදුන්ගේ සිරිපතුල් පිහිටුවා ඉදිකළ විහාරයේ ආරක්ෂාව පිණිස දිවතිලකායි සහ මණිමේකලෛ දෙවඟනන් දෙදෙනාගේ ප්‍රතිමා ස්ථාපිත කළ බවට වන සඳහන **මණිමේකලෛ** කාව්‍යයේ දෙවඟන පිළිබඳ ව සඳහන් වන අවසාන අවස්ථාව යි ( Holmström,1996:174). ඒ අනුව ඇය බුදු දහමේ මෙන් ම බුදුන්ගේ ආරක්ෂක දේවතාවියකගේ තත්ත්වයට පත් වී ඇත. කන්නකී උදෙසා තැනූ දෙවොලක් පිළිබඳ තොරතුරු හමුවුව ද, මණිමේකලා දෙවඟන උදෙසා දෙවොලක් තැනූ බවට කිසිදු සඳහනක් හමු වන්නේ නැත.

මණිමේකලා දෙවඟන ඉන්ද්‍ර දෙවියන් උදෙසා පැවැත්වෙන වාර්ෂික උත්සවය නො සලකා හැරීම ගැන උදහසට පත් ව චෝල රජුට ශාප කිරීමෙන් පෙනී යන්නේ කාවේරි පටුනෙහි ඉන්ද්‍ර දෙවියන් බෞද්ධ දෙවියකු සේ සලකා පූජා පවත්වන්නට ඇති බවයි. ඉන්ද්‍ර දෙවියන් පුහාරයේ විහාර හතක් සාදා බුදුන්ට කැප කළ බව සඳහන් වීමෙන් එය තව දුරටත් සනාථ වේ (Holmström,1996:167). බුදුදහමෙහි අන්තර්ගත ප්‍රධාන ධර්ම කරුණු වන චතුරාර්ය සත්‍යය, ප්‍රතීත්‍ය සමුත්පාදය, ආදිය මැනවින් ගෙනහැර දක්වන කතුවරයා, සිය කෘතියෙහි එකල පැවති සාංඛ්‍ය, න්‍යාය ආදි ෂට් දර්ශන හා ජෛන, ආජීවක ආදි ආගම්වල නිස්සාර බව මණිමේකලා දෙවඟන ලවා ප්‍රකාශ කරවීමේ දැඩි උත්සාහයක නිරත වේ. මෙම කෘතිය පුරා බෞද්ධාගම පිළිබඳ චාත්තනාර්ගේ ඥානය ප්‍රකට කරවීම සඳහා ඔහු උපයෝගි කරගනුයේ මණිමේකලා දෙවඟනයි.

දෙමළ සාහිත්‍යයේ නිරූපණය වන මණිමේකලා දෙවඟනගේ භූමිකාව පාලි සාහිත්‍යයේ භූමිකාවට යම්තාක් දුරකට සමාන වේ. බෞද්ධ ජාතක කථාවල මෙන් ම **සිලප්පදිකාරම්** සහ **මණිමේකලෛ**

වීර කාව්‍ය ද්වය ද පූර්ව ජන්මයන් හා පූර්ව කර්මයන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට ඇත. ඇය පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ ඇතුළත් ඉතා ප්‍රකට කථා ද්වය වන්නේ මහාජනක ජාතකය හා සංඛ ජාතකයයි. ඇතැම් සිදුවීම් අතින් සමීප බවකින් යුක්ත මේ කථා දෙක ඇතැම් සිදුවීම් අතින් බෙහෙවින් දුරස් වේ. මෙම ජාතක කථා ද්වයෙන් ම කියවෙනුයේ බුදුන්ගේ පූර්ව ජන්මයන් පිළිබඳ වයි. මහාජනක ජාතකයේ දැක්වෙන පරිදි වේදේහ රට, මිථිලා නුවර, මහාජනක රජුගේ වැඩිමහල් පුතු අරිට්ඨජනකගේ පුත්‍රයා වෙළඳාම සඳහා සුවණ්ණභූමියට යාත්‍රා කරමින් සිටිය දි සත් දිනකට පසු මුහුද රළු ව නැව ගිලෙන්නට වූ විට ගිතෙල් සමග උක් හකුරු අනුභව කොට, සිරුරෙහි තෙල් ගල්වා නැවේ කුඹගස මුදුනට නැග මිථිලාව දෙසට ඉස්බක් තරම් දුරට පැන ඉමහත් වීර්යයෙන් පීනන්නට විය. ඔහු සත්පුරුෂයකු බැවින් සිව්වරම් දෙවිවරු සය දිනක් මුහුද ගැන විමසිලිවත් නො වූ මණිමේකලා දෙවඟනට ඒ ගැන දැන්වීය. විපත දුටු දෙවඟන මහාජනක කුමාරයා දැක ඔහු ඉදිරියේ ඉතා විසිතුරු ලෙස පෙනී සිටියා ය. අනතුරුව ගාථාවකින් ඇය විමසා සිටියේ වෙරළක් පෙනෙන්නට නො තිබුණ ද මෙතරම් වීර්යයෙන් පීනන්නේ කුමක් නිසා ද යනුවෙනි. පරතෙරක් නො දැක වුව ද තමා උත්සාහ කොට ගැහැටින් මිදෙන බව බෝසතුන් පැවසූ විට සතුටින් ඔහුගේ ගාථාවලට සවන් දි අවසානයේ ඔබගේ සිත යම් තැනකට ඇලුණේ ද, එතැනට සුවසේ යන ලෙස පවසා, කුමාරයා මල් කලඹක් මෙන් දෑතින් ඔසවා උරමත තබාගෙන අදරැති පුතකු වඩාගෙන යන මවක මෙන් අහසට පැන නැග මිථිලාවට ගොස් අඹ වනයෙහි මංගල්‍ය ශෛලාසනයේ තබා උයනට අධිපති දෙවියාගේ ආරක්ෂාව සලස්වා සිය භවනට ගියා ය (ජාතකට්ඨ කථා vii,53-58). දෙහිවල කරගම්පිටියේ සුබෝධාරාම විහාරයේ ප්‍රතිමාගෘහයේ අන්තරාලයේ මහාජනක ජාතක සිතුවමේ මණිමේකලා දෙවඟන නිරූපණය කොට තිබේ. එමෙන් ම තායිලන්තයේ වට් යයි ඉන්ද්‍රාරාම්, ටා කු, කොන්කාරාම්, වට් චොං නො න්සි ආදි විහාරයන්හි නිරූපිත මහාජනක ජාතක සිතුවම්වල ද මණිමේකලා දෙවඟන සිතුවමට නගා තිබේ (Lekshukum,2000:238).

මණිමේකලා දෙවඟන ගැන සඳහන් වන අනෙක් ප්‍රකට මූලාශ්‍රය වන්නේ සංඛ ජාතකයයි. එම ජාතකයට අනුව මොලිනී නම්

3rd Proof



නගරයෙහි විසූ සංක නම් බ්‍රාහ්මණයා නිතිපතා දන් දීමෙහි යෙදී සිට ධනය පිරිහී ගියහොත් දන් දෙන්නට නො හැකි වන බව සිතා එසේ වීමට පෙර, ධනය සොයා සුවණ්ණභූමි බලා පිටත් විය. එසේ යාත්‍රා කරමින් සිටිය දී සත්වන දිනයෙහි නැව සිදුරු වී ජලය ගලා වුත් නැව ගිලෙන්නට විය. නැවේ සිටි බොහෝ ජනයා මසුන්ට ගොදුරු වූ නමුත් බ්‍රාහ්මණයා ගිතෙල් සමග උක් හකුරු ආහාර පිණිස ගෙන සිය සේවකයෙක් ද සමග නැවේ කුඹ ගසට නැග සිය නගරය දිසාවට පැන පිහිනා යන්නට විය. මහාජනක ජාතකයේ දැක්වෙන අයුරින් ම දින සයක් මහ මුහුද ගැන විමසිලිවත් වන්නට නො හැකි වූ මණිමේකලා දෙවඟන සිව්වරම් දෙවිවරුන්ගේ මග පෙන්වීම මත ඔහුට පිහිට විය. මෙහි සංක බ්‍රාහ්මණයා බෝසතුන් විය. මහා ජනක ජාතකයට වඩා මෙහි දක්නා ලැබෙන විශේෂත්වය වනුයේ බෝසතුන් ඇයට ආමන්ත්‍රණය කරන ආකාරයෙන් ඇයගේ රූප සෞන්දර්ය වර්ණනා වීමයි. සිය ප්‍රමාදය ගැන පසුතැවිලි වන දෙව්දුව බ්‍රාහ්මණයා මුහුදෙහි ගිලී මළහොත් තමා අතිශයින් ගැරහිය යුත්තියක වන බව සිතා රන් පාත්‍රයකට දිව්‍ය භෝජන පුරවා වාත වේගයෙන් ඔහු කරා ගොස් සත් දිනක් අහරක් නො මැති හෙයින් වහා එය අනුභව කරන ලෙස පැවසුවා ය. එහෙත් තමා පෙහෙවස් සමාදන් ව සිටින බව පවසා ඔහු අහර ප්‍රතික්ෂේප කළේ ය. ඔහු එය ප්‍රතික්ෂේප කරනු අසා ඔහුගේ සේවකයා විමසන්නේ ඔහු හැර අන් කවරෙක් මෙහි සිටී ද යනුවෙනි. එහි අර්ථය සේවකයාට දෙවඟන දෘශ්‍යමාන නො වන බවයි. එවිට බ්‍රාහ්මණයා පවසන්නේ ''පැහැපත් මුහුණ ඇති සිත් ගන්නා සුලු රන් අබරණින් සැරසුණු ස්ත්‍රියක් රන්මුවා පාත්‍රයක් ගෙන දන් වළඳව යි'' තමාට පවසන බවයි. ඇය කවුරුන් දැයි විමසා දෙව්දුවක් බව දැන අනතුරුව ඇය ආමන්ත්‍රණය කොට මෙය කුමන විපාකයක ඵලයක්දැ යි විමසන්නේ 'මනා ඉඟටිය ඇති, යහපත් බැම ඇති, මනා වූ මධ්‍ය ප්‍රදේශ ඇති, යහපත් සිරුරු ඇති, සුන්දර වූ කලවා ඇති'' ආදි වශයෙන් ඇයගේ කායික සුන්දරත්වය ප්‍රකට වන අයුරිනි. අන් කිසිදු මූලාශ්‍රයක දෙවඟනගේ රූපශ්‍රීය පිළිබඳ මෙබඳු විස්තරයක් දක්නට නො ලැබේ. එසේ ම බ්‍රාහ්මණයා ඇයගෙන් ඉල්ලන්නේ කුඩා වූ එක් ඔරුවක් ඇති නැවක් නො ව මනා වූ නැවක් මවා දෙන ලෙසයි. ඒ අනුව ඇය බෝසතුන් සඳහා සත් රුවනින් නැවක් මවා ඊට ඉන්ද්‍රනීලමය කුඹ ගස් තුනක් ද රන්මුවා යොත්, රිදී නැංගුරම් හා රන්මුවා රුවල් ද යොදා බමුණා

වැළඳ අලංකාර කළ නැවට නංවන ලද බව ද සඳහන් වේ. මේ අනුව සංක ජාතකය මහාජනක ජාතකයෙන් බොහෝ වෙනස් වේ. එසේ ම අවසානයේ වර්තමාන කථාවෙන් මණිමේකලා දෙව්දුව උත්පලවණ්ණා තෙරණිය බව ද සංක බ්‍රාහ්මණයා බෝසතුන් බව ද පැවසේ (**ජාතකට්ඨ කථා** vii,84-85).

මියන්මාරයේ පණ්ණාස ජාතක කථා අතරට සංක ජාතකය ද අයත් වේ. මියන්මාරයේ පණ්ණාස ජාතක කථා අතර සමුද්දඝෝෂ ජාතකයෙහි ද මණිමේකලා දෙව්දුව සමුද්‍ර මධ්‍යයෙහි විපතට පත් බෝසතුන් ගලවාගත් බව සඳහන් වේ. එහි අතීත කථාවේ කනකවතී දේවිය මහාප්‍රජාපතීගෝතමිය බවත්, මණිමේකලා දෙවඟන උත්පලවණ්ණා බවත් සඳහන් වේ (Paññása Jataka,1981:71). චන්දකුමාර ජාතකයේ සුවණ්ණභූමි බලා යාත්‍රා කරමින් සිටි බෝසතුන් සමුද්‍රයේ දි මණිමේකලා දෙවඟන විසින් ගලවාගත් බව සඳහන් ය (Paññása Jataka,1981,:267). අක්ඛරලිඛිත ජාතකයේ ද එසේ ම සඳහන් වේ (Paññása Jataka,19811981ඃ519). සෑම ජාතක කථාවකින් ම දෙවඟනගේ නො සැලකිලිමත් බව ප්‍රකට වේ. ඇය නිතර ම පවසන්නේ තමා දින සයක් මහ මුහුද ගැන සොයා බැලීම අතපසු කළ බවයි. ගලවාගත යුතු පුද්ගලයෙක් වෙතොත් සිව්වරම් දෙවිවරු නො වළහා ඇයට ඒ ගැන දැනුම් දෙති. එහෙත් මණිමේකලෙ කතුවරයා ඇයගේ භූමිකාව නිරූපණය කොට ඇත්තේ තම වගකීම ඉතා සැලකිල්ලෙන් ඉටු කරන දෙවඟනක් ලෙසින් ය. පන්සිය පනස් ජාතකයට ඇතුළත් නො වන ජාතක කථා අන්තර්ගත **සකේස ධාතුවංසයෙහි** බුදුන්ගේ කේශ ධාතු නිදන්කොට උන්වහන්සේගේ ශ්‍රාවකයන් හය දෙනෙක් විසින් දක්ෂිණ භාරතයේ ස්තූප සයක් ඉදි කරන ලද බවත්, ඉන් එක් ස්තූපයක් දෙමළ වෙළඳුන් සමූහයක් විසින් සොයාගන්නා ලද බවත්, එසේ ම බුදුන්ගේ කේශධාතු නිදන් කොට මණිමේකලා දෙවඟන විසින් ද මුහුදු වෙරළේ ස්තූපයක් ඉදි කළ බව එහි තුන්වන පරිච්ඡේදයේ සඳහන් වෙතැයි ද පරණවිතාන පවසයි (පරණවිතාන, 1931ඃ 38).

**සද්ධර්මාලංකාරයේ** තුන්යහළු වර්ගයේ ඇතුළත් එලකබණ්ඩදින්න වස්තුවෙහි වෙළඳාම පිණිස නැව් නැගී යන පුරුෂයන් දෙදෙනා අතරින් සත්පුරුෂ පුද්ගලයා නැව ගිලී අනතුරට පත් ව තව දුරටත්

පිහිනාගත නො හී දියෙහි ගිලෙන්නට වූ විට මණිමේකලාව ඔහුට පිහිට වූ ආකාරය සඳහන් වේ. කෙළෙහිගුණ දන්නා සත්පුරුෂ මනුෂ්‍යයෙකු බව දැන ඔහුගේ ගුණ සඳහන් කරමින් දියෙහි ගිලුණු පුතකු ගොඩගන්නා පෙම්බර මවක සේ වහා දිව අවුත් තම ආනුභාවයෙන් ඔහු ගොඩ ලා අනතුරුව සෙසු පුරුෂයා ද ගොඩ ලූ බව එහි තව දුරටත් විස්තර වේ. එම පුරුෂයන් දෙදෙනා අතරින් අකෘතඥ පුරුෂයා සද්පුරුෂයාගෙන් කෙසේ ගොඩ ආවේ දැයි විමසූ කළ දෙවඟන දෘශ්‍යමාන ව සිට පවසන්නේ තමාගේ ආනුභාවයෙන් ඔහු ගෙනවුත් ගොඩ ලූ බවත්, මව්පියන් පෝෂණය කිරීම, තිසරණයෙහි පිහිටීම, පංචශීලය, අෂ්ටාංගශීලය, ප්‍රාතිමෝක්ෂ සංවරශීලය තමාගේ ජීවිතය සේ සිතා ශීල සංරක්ෂණයෙහි නියුක්ත සත්ත්වයාට උපද්‍රවයක් වන්නට නො දී දෙවියන් ආරක්ෂා කරන බවයි. එසේ ම කය, වචනය සහ මනස යන තුන් දොරින් නිරන්තර සුචරිත ධර්මයෙහි හැසිර වාසය කෙරේ ද ඔහුට ව්‍යසනයක් වූ කළ දෙවියෝ ඔහු ආරක්ෂා කරන බවත්, පර්වත, වන දියගොඩ ආදි සෑම තැනක දී ම දෙවියන් ආරක්ෂාව සලසන බවත්, මණිමේකලා දෙවඟන ඔහුට පහදා දුන් බව ද සඳහන් ය. ඒ පුරුෂයා එවිට තමා දුන් දානයක් හෝ රැකි ශීලයක් නැතැ යි කී කළ, තම ජීවිතය පවා නො තකා තමාට පිහිනීමට උපකාරී වූ පුවරු කඩ අන්‍යයකුට පරිත්‍යාග කිරීම ඊට හේතු වූ බව දෙවඟන ඔහුට පෙන්වා දුන්නා ය (**සද්ධර්මාලංකාරය**, 2010ඃ283-286).

**සද්ධර්මාලංකාරයෙහි** සඞසදත්ත වර්ගයේ හෙමා වස්තුවෙහි මණිමේකලා දෙවඟන ගැන සඳහන් වන්නේ හේමා නම් ස්ත්‍රියගේ රූප සෞන්දර්ය ප්‍රකට කරවනු පිණිස ය. ඒ අනුව අනුරාධපුරයට පශ්චිම භාගයෙහි පිහිටි ගමක අතිශය රූමත් රන්වන් පැහැයෙන් යුත් තරුණියක් විසුවා ය. වෙළඳාම පිණිස එම ගමට ආ පුරුෂයකු සමග සමාගමයෙන් කල් ගෙවූ ඈ, ඔහු ගමෙන් පිටව ගොස් නැවත නො පැමිණි බැවින් ඔහු සොයා යන ගමනේ ගමන ඉක්මන් වනු පිණිස මහ මුහුදට පැන පීනා යන්නට විය. ඈ දුටු නාග රාජයෙක් ඈ නාග කන්‍යාවක් ද නැතිනම් මණිමේකලා නම් දිව්‍ය ස්ත්‍රිය දැයි විපිළිසර ව හුන් බව කිය වේ. හෙමා නම් වූ ස්ත්‍රිය අතිශය සුන්දර බව පවසා ඇය මණිමේකලා දෙවඟනට සම කිරීමෙන් සංක ජාතකයේ සඳහන් වන්නාක් මෙන් ඇය අතිශය ශෝභමාන රූ

සපුවකින් යුක්ත බව ව්‍යංගයෙන් කියවේ (**සද්ධර්මාලංකාරය**, 2010ඃ734).

මණිමේකලා දෙව්දුව විජයොත්‍ර නම් සංඛයක් පිඹිමින් සිටි බව **අමාවතුරෙහි** අමෘත ප්‍රවාහයෙහි දෙවදමන නම් සතළොස්වන පරිච්ඡේදයේ දැක්වේ (**අමාවතුර**, 1901ඃ50). 17 වන ශත වර්ෂයට පමණ අයත් වන **රාජාවලියේ** සඳහන්වනුයේ මණිමේකලා දෙවඟන වැස්සවලාහක දෙවියන් සමග මුහුදට බිලිදුන් විහාරමහා දේවිය නිරුපද්‍රිතව රුහුණට ගෙනයාමට වගබලා ගත් බවයි. මුහුද ගලන බව ඇසූ කැලණිතිස්ස රජු තම දියණිය ඉස්සෝදා නහවා නොයිඳුල් දුහුල් සළු අන්දවා ආබරණ පලඳවා ඔරුවක් ගෙන ඔරුව ඇතුළේ පියන් පත වසා ඔරුව මතුපිට පත ලියා බැඳ මුහුදට යැවූ බවත්, එසේ මුහුදට බිලි දුන් කුමාරිය මහ පින් ඇති බැවින් හා මෛත්‍රීය බුදුනට මවු ව උපන්නා බැවින් වලාහක දෙවියෝත්, මූද මණිමේකලාවෝත් ඔරුව පවනවාත වේගයෙන් දකුණු දිග දුවමින් රුහුණට පා කළ බව සඳහන් වේ (**රාජාවලිය**, 1976ඃ171).

දේශීය යාතුකර්ම සාහිත්‍යයේ ද අවස්ථා කිහිපයක මණිමේකලා දෙවඟන පිළිබඳ සඳහන් වේ. දෙවොල්මඩු ශාන්තිකර්මයේ පුරාවෘත්තයට අනුව දෙවොල් දෙවියන් ඇතුළු පිරිස කාවේරියේ සිට බඩු පුරවාගත් නැව් සතක නැගී වෙළඳාම පිණිස සීහලද්වීපයට පැමිණෙමින් සිටිය දි දින සයක් ගතවීමෙන් අනතුරු ව සත්වැනි දිනයේදි පූර්ව කර්මයක් හේතුවෙන් නැව් මුහුදේ ගිලෙන්නට වූහ. එහි දි මණිමේකලා දෙවඟන ගල් පහුරු හතක් මවා දි ඔවුන්ට පිහිට වූ බව සඳහන් වේ.

''ගිගුම් දිදි මහමෙර සෙලවි සෙලවි යේ
රැගුම් දිදි සමුදුර කැළඹි කැළඹි යේ
මෙගුන් ජල වසන මණි මේකලාවි යේ
අදින් කතරගම දෙවි පිහිට වේවි යේ''[1]

යාතුකර්ම ඇදුරන් අතර වඩාත් ප්‍රචලිත ව පවතින්නේ දෙවොල් දෙවි ඇතුළු පිරිසට ගල්පහුරු මවා දුන්නේ ශක්‍ර දේවේන්ද්‍රයා බවයි. එහෙත් පද්‍යයෙහි සඳහන් වන්නේ එය මණිමේකලා දෙවඟන විසින් සිදු කරන ලද බවයි.

"ගියේ ගල් කොර ගැසී-නැව් සතම ගිය නැසී
අඬ අඬා දුක් වැදී-වන්නපුර සයුරේදී
කියා කම්පා වෙතී-රැලින් රැල පීනතී
මුහුද මණිමේකලා-පෙනුණි දිවැසින් බලා
මෙහෙම වන් නපුරකට-පිහිටවම්මැයි සොඳට
කියා දෙවියෝ එවිට-ගල් පහුර මවාලා
පුළුන් රැල සේ දරා-තොස්ව නැව් නැගීලා
එන සඳෙහි ගොඩ බලා-පතිනි දෙවියෝ එවිට"[2]

දෙවොල් දෙවියන් ඇතුළු පිරිස මුහුදු යාත්‍රාවෙහි යෙදුණු වෙළෙන්දන් ය. **සිලප්පදිකාරම්** සහ **මණිමේකලෛ** කාව්‍ය ද්වයේ සඳහන් කෝවලන් ද වෙළඳ තරුණයෙකි. වෙළඳ යාත්‍රිකයන් අතර මණිමේකලා ඇදහිල්ල ප්‍රචලිත ව පවතින්නට ඇතැයි සිතිය හැකි ය. ගරා යකුමේ දෝෂ හැරීමේ හා ගෙවල් නිවීමේ ගායනාවලින් ද ඇළ, දොළ ඔස්සේ ගලා ගඟ දියට එක්වන ජලය මහමුහුදට ගෙන යන්නේ මණිමේකලා දෙවඟන බව කියවේ (Obeysekara, 1986: 182).

විහාර බිතු සිතුවමෙහි, ජාතක පොතෙහි සහ දේශීය යාතුකර්මයෙහි අන්තර්ගත ව පවත්නා වස්තු විෂයයක් වන මණිමේකලා දෙවඟන පිළිබඳ විශ්වාසය පොදුජනයා අතර ප්‍රචලිත ව පවතින්නට ඇතැයි සැලකීමට ප්‍රමාණවත් සාධක තිබේ. ඇය විහාරමහා දේවියට රුහුණු පුරයට යාත්‍රා කිරීමට උදව් වූයේ යයි පැවසෙන රාජාවලී සඳහන එය තව දුරටත් තහවුරු කරයි. ඒ අනුව දක්ෂිණ භාරතය සහ බුදු දහම ප්‍රචලිත ව පැවති රටවල් ගණනාවක බෞද්ධ දෙවඟනක් ලෙස පොදු ජනයා අතර පිළිගැනීමට පාත්‍ර ව සිටි මණිමේකලා දෙවඟන වර්තමානය වන විට සම්භාව්‍ය සාහිත්‍ය පරිශීලනය කරන්නන් අතර පමණක් ප්‍රචලිත දෙවඟනක් බවට පත් ව ඇති බව පෙනේ. දේශීය යාග සාහිත්‍යයේ අන්තර්ගත වුව ද, යාතුකර්ම ඇදුරන් අතර ඇගේ නාමය අප්‍රචලිත බැවින් අනාගතයේ දී එය මුළුමනින් ම භාවිතයෙන් ඉවත්වනු ඇත. මියන්මාරයේ මණිමේකලා නර්තනය නමින් පවත්වන නූතන සම්භාව්‍ය නර්තනය **මණිමේකලෛ** නම් වීර කාව්‍යයේ කථා නායිකාව ද නැතහොත් මණිමේකලා දෙවඟන දැයි අවිනිශ්චිත ය. ඇදහිල්ලක් වශයෙන් වන්දනාමානයට පාත්‍ර වූ බවට සාධක නො මැති එහෙත් පොදු ජන විශ්වාසයක් ලෙස විවිධ ක්ෂේත්‍ර අරා විහිදී පැවති මෙම විෂය විද්‍යාර්ථීන්ගේ මෙන් ම පර්යේෂකයන්ගේ ද අවධානයට පාත්‍ර විය යුතු ය.

**ආන්තික සටහන්:**

1 කර්තෘ අඥාත අත් පිටපතකින්
2 කර්තෘ අඥාත අත් පිටපතකින්

**ආශ්‍රිත ග්‍රන්ථ:**


**අමාවතුර**, 1901, සම්පාදක ද සිල්වා, සී. ඇම්. ඔස්ටින්, කොළඹ, ජේ. ඩී. ප්‍රනාන්දු

**ජාතකට්ඨ කථා**, vi කොටස, 2007, *මහා ජනක ජාතකය 53-58*, පරි. සෝමින්ද හිමි, මාවනානේ, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,

**ජාතකට්ඨ කථා**, iv කොටස, 2007, *සංඛ ජාතකය 79-86,* පරි. සෝමින්ද හිමි, මාවනානේ, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,

**රාජාවලිය**, 1976, සංස්ඃ සුරවීර, ඒ. වී., කොළඹ, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්.

**සද්ධර්මාලංකාරය**, 2010, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Ayyangar, Krishnaswami, 1928, **Manimekhala in its Historical Settings**, London, Luzac & Company

Levi, Sylvain, 1996, *Manimekhala, a Divinity of the Sea*, The Indian Historical Quarterly, Vol.VI, No.4, 1930.12, pp. 597-614, Calcutta, Oriental Press

Leksukhum,Santi, 2000, **Temples of Gold**, London, Thames &Hudson

Obeysekara, Gananath, 1984, **The Cult of the Goddess Pattini**, Chicago, University of Chicago Press

Paranavitana, Senarath, 1931 January, Ceylon Literary Register Vol. I **Goddess Manimekhala**, pp37-38, Colombo, Ceylon Observer.

**Paññása Jataka**,1981, **Zimme Pannasa**, Vol.1, Jatakas 1-25, Ed. Padmanabh S. Jaini, Routledge & Kegan Paul. Ltd. London

**Silappadikaram/Manimekalai**,1996, Ed.Lakshmi Holmström, Madras, Orient Longman.